# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2320/44 – 2023 පෙබරවාරි මස 22 වැනි බදාදා – 2023.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 883, අහුගොඩ නැගෙනහිර, අංක 886, හිරිපත්වැල්ල ග්‍රාම නිළධාරි කොට්ඨාසවල, අහුගොඩ, කෙහෙල්වත්තහේන ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/PLG/2020/261 සහ 2021.09.16 දිනැති ප්‍රගමන අනුරේඛනයෙහි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

**01. කැබලි අංක - 1 - ගන්දරඇළකුඹුර - ප්‍රමාණය :හෙක්. 0.0013**

උතුරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ ඒ. එම්. ජයසුන්දර බණ්ඩාර අධිකාරි හිමිකම් කියන ගන්දරඇළකුඹුර; නැගෙනහිරට: ඒ. එම්. ජයසුන්දර බණ්ඩාර අධිකාරි හිමිකම් කියන ගන්දරඇළකුඹුර; දකුණට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; බටහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය.

**02. කැබලි අංක - 2 - කන්දෙහේන - ප්‍රමාණය :හෙක්. 0.0283**

උතුරට: ඩී. රංජිත් පේදිරිස් හිමිකම් කියන කන්දෙහේන, ජේ. එම්. ශාලින්ද බණ්ඩාර හිමිකම් කියන මොරගහමුලවත්ත සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; නැගෙනහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ ඩී. රංජිත් පේදිරිස් හිමිකම් කියන කන්දෙහේන; බටහිරට: ඩී. රංජිත් පේදිරිස් හිමිකම් කියන කන්දෙහේන.

**03. කැබලි අංක - 3 - කන්දෙහේන - ප්‍රමාණය :හෙක්. 0.0747**

උතුරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; නැගෙනහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: කැබලි අංක 4, එම්. ඩී. නිමාලි හඳුන්ගේ හිමිකම් කිනන දහයියාගලවත්ත සහ ඩී. රංජිත් පේදිරිස් හිමිකම් කියන කන්දෙහේන; බටහිරට: ඩී. රංජිත් පේදිරිස් හිමිකම් කියන කන්දෙහේන සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය.

**04. කැබලි අංක - 4 - දහයියාගලවත්ත - ප්‍රමාණය :හෙක්. 0.0005**

උතුරට: කැබලි අංක 3 සහ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; නැගෙනහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ එම්. ඩී. නිමාලි හඳුන්ගේ හිමිකම් කියන දහයියාගලවත්ත; බටහිරට: ඩී. රංජිත් පේදිරිස් හිමිකම් කියන කන්දෙහේන.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2020/HW/17.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල,
2022 නොවැම්බර් මස 30 වැනි දින.

EOG 02 - 0246

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.